# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1984 අංක 33 දරන විදේශීය ණය (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1984 අගෝස්තු මස 23 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---

1984 අගෝස්තු මස 24 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැකිය

මිළ : ශත 45 යි

තැපැල් ගාස්තුව : ශත 60 යි

# 1984 අංක 33 දරන විදේශීය ණය (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1984 අගෝස්තු මස 23 වන දින]

එල්. ඩී.—ඕ. 38/83

## 1957 අංක 29 දරන විදේශීය ණය පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

ලුහුඬු නාමය.

**1.** මේ පනත 1984 අංක 33 දරන විදේශීය ණය (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

1957 අංක 29 දරන පනතේ 5 වන වගන්තිය සංශෝධනය කිරීම.

2. 1980 අංක 23 දරන පනතින් ප්‍රතියෝජනය කරන ලද 1957 අංක 29 දරන විදේශීය ණය පනතේ 5 වන වගන්තියේ "විදේශීය ණය" යන්නෙහි අර්ථ කථනය වෙනුවට පහත දැක්වෙන අර්ථ කථනය ආදේශ කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

' "විදේශීය ණය" යන්නෙන්—

(අ) විදේශීය ආණ්ඩුවක් විසින් හෝ විදේශීය ආණ්ඩුවක නියෝජ්‍යායතනයක් විසින් ; හෝ

(ආ) යම් ජාත්‍යන්තර සංවිධානයක් විසින් ; හෝ

(ඇ) පොදුවේ හෝ යම් විශේෂ ගනුදෙනුවක් සම්බන්ධයෙන් හෝ ශ්‍රී ලංකාවේ ආණ්ඩුව විසින් අනුමත කරනු ලබන නැතහොත් ගනුදෙනුවේ ස්වභාවය සැලකිල්ලට ගෙන අදාළ තැනැත්තාගේ හෝ පුද්ගල මණ්ඩලයේ අනන්‍යතාව කඩිනමින් නිශ්චය කළ නොහැකි බව අමාත්‍යවරයාගේ මතය වන අවස්ථාවක, අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලබන, ශ්‍රී ලංකාවෙන් පිටත වූ සංස්ථාගත කරනු ලැබූ හෝ සංස්ථාගත නොකරනු ලැබූ යම් තැනැත්තකු හෝ පුද්ගල මණ්ඩලයක් විසින්

ශ්‍රී ලංකාවේ ආණ්ඩුවට හෝ රාජ්‍ය සංස්ථාවකට හෝ පොදු ව්‍යවසායකට හෝ කවර වූ හෝ ව්‍යවහාර මුදලකින් ප්‍රදානය කරනු ලබන ණයක් හෝ කවර වූ හෝ ආකාරයක මූල්‍ය බැර කිරීමක් හෝ ණය දීමක් අදහස් කෙරෙන අතර,

(i) අවස්ථාවෝචිත පරිදි, ශ්‍රී ලංකාවේ ආණ්ඩුව, රාජ්‍ය සංස්ථාවක් හෝ පොදු ව්‍යවසායක් සහ ශ්‍රී ලංකාවෙන් පිටත යම් තැනැත්තකු අතර වූ යම් ගනුදෙනුවක් සම්බන්ධයෙන්, අවස්ථාවෝචිත පරිදි, ශ්‍රී ලංකාවේ ආණ්ඩුවේ හෝ ඒ රාජ්‍ය සංස්ථාවේ හෝ පොදු ව්‍යවසායේ හෝ යම් බැඳීමක් නිදහස් කරන්නා වූ යම් විදේශීය ආණ්ඩුවකට, නියෝජ්‍යායතනයකට, සංවිධානයකට, තැනැත්තකුට හෝ පුද්ගල මණ්ඩලයකට ගෙවීමට, අවස්ථාවෝචිත පරිදි, ශ්‍රී ලංකාවේ ආණ්ඩුව හෝ ඒ රාජ්‍ය සංස්ථාව හෝ පොදු ව්‍යවසාය පොරොන්දු වන යම් මුදල් ප්‍රමාණයක් ; සහ

2—ඒ 077930—(84/07)

(ii) පොදුවේ හෝ විශේෂ ගනුදෙනුවක් සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ ආණ්ඩුව විසින් අනුමත කරනු ලබන නැතහොත් ගනුදෙනුවේ ස්වභාවය සැලකිල්ලට ගෙන, අදාළ තැනැත්තාගේ හෝ පුද්ගල මණ්ඩලයේ අනන්‍යතාව කඩිනමින් නිශ්චය කර ගත නොහැකි බව අමාත්‍යවරයාගේ මතය වන අවස්ථාවක, අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලබන ශ්‍රී ලංකාව ඇතුළත වූ සංස්ථාගත කරනු ලැබූ හෝ සංස්ථාගත නොකරනු ලැබූ යම් තැනැත්තකු හෝ පුද්ගල මණ්ඩලයක් විසින්, ශ්‍රී ලංකාවේ ආණ්ඩුවට හෝ රාජ්‍ය සංස්ථාවකට හෝ පොදු ව්‍යවසායකට ශ්‍රී ලංකා රුපියල හැර වෙනත් කවර වූ හෝ ව්‍යවහාර මුදලකින් ප්‍රදානය කරනු ලබන ණයක් හෝ කවර වූ හෝ ආකාරයක මූල්‍ය බැරකිරීමක් හෝ ණයදීමක්

ඊට ඇතුළත් වේ.'.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 150 යි. (විදේශීය) රු. 200 යි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ ගිවිසුම්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 150 යි. (විදේශීය) රු. 200 යි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන ඒ ඒ වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.